සබරගමුව පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සති පාසල

10 ශ්‍රේණිය | නර්තනය | අප්‍රේල් 03 සතිය

01. **නිපුණතාව-** 1.නර්තනය හා සබැඳි මූලධර්ම අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි.

02. **නිපුණතා මට්ටම-** 1. නිවැරදි අංගහාර අනුගමනය කරමින් සාම්ප්‍රදායික නර්තන අංග ප්‍රදර්ශනය කරයි

03 **පාඩම/ඒකකය-** 1. වන්නම් නර්තනය කරමු.

**ඉගෙනුම් පල-**

- උඩරට සැවුලා වන්නමේ අනන්‍යතා ලක්ෂණ විස්තර කරයි.
- වන්නමේ තාල රූපය අවබෝධ කර ගනී.
- වන්නමේ නියමිත නාද මාලාව හඳුනා ගනී.
- වන්නම නියමිත නාද මාලාවට අනුව ගායනා කරයි.
- වන්නම ගයමින් මාත්‍රා නර්තනය කරයි.
- කස්තිරම,සීරුමාරුව,අඩව්ව තාල් තබමින් කියයි.
- කස්තිරම,සීරුමාරුව,අඩව්ව නර්තනය කරයි.
- නියමිත අංගහාර අනුගමනය කරමින් වන්නම නර්තනය කරයි.
- ශිල්පීය ප්‍රාගුණ්‍ය වර්ධනයට සතතාභ්‍යාස වැදගත් බව පවසයි.
- තම නර්තන හැකියා අන්‍යයන් ඉදිරියේ රඟ දැක්වීමට පෙළඹෙයි.
- අන්‍යයන් තම නර්තන හැකියා අගය කරයි.

04.**ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්**

- දුවේ පුතේ 7 ශ්‍රේණියේ ඉගෙන ගත් ප්‍රස්තාර පාඩම සිහියට නගා ගන්න.එවිට
 මෙම පාඩමට අදාල තාල රූපය පිළිබඳ අවබෝධයක් ලැබේවි.දැන් වන්නමේ තිතට අනුව තාල් තබමින් බෙර පදය කියමු.ඔබට අවබෝධ වේවි මාත්‍රා 2+4 තාලයට අදාල බෙර පදය සහ වන්නමේ බෙර පදය සමාන බව.
- දුවේ පුතේ අපි දැන් වන්නම ගායනා කල ආකාරය නැවත මතක් කර ගනිමු.
- ඔබට මතක ඇති පෙර වසර වල වන්නම් නර්තනය කළ ආකාරය.අපි දැන් වන්නමට මාත්‍රා නර්තනය කරමු.මේ සඳහා ගොඩ සරඹ ද උපයෝගී කර ගත හැකිය.

- ඊළඟට අපි කස්තිරම,සීරුමාරුව,අඩව්ව නර්තනය කරමු.ඔබට මේ සඳහා අන්තර්ජාලය, You Tube නාලිකා හෝ වෙනත් ඉගෙනුම් උපකරණ උපයෝගී කර ගත හැකිය.
- ඉතින් දුවේ පුතේ අපි දැන් වන්නම ගයමින් නියමිත අංගහාර අනුව නර්තනය කරමු.

එහෙනම් දුවේ පුතේ පාඩම ඇසුරින් පහත දක්වා ඇති ක්‍රියාකාරකමේ යෙදෙමු........

**ඇගයීම-**

01. සැවුලා වන්නමේ තාල රූපය හා බෙර පදය කුමක්ද ?

02. 10 ශ්‍රේණියට අදාල සැවුලා වන්නම නියමිත නාද මාලාවට අනුව ගැයීමට පුරුදුවන්න.

03. වන්නම නිවැරදි අංගහාර අනුව නර්තනය සඳහා සතතාභ්‍යාසයේ යෙදෙන්න

04 **.ඉහත ක්‍රියාකාරකම සඳහා උපකාර කරගත් පොත් පත්,web side,LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක-**

1. e තක්සලාව- https://www.e-thaksalawa.moe.gov.lk/
2. e නැණ පියස https://enenapiyasa.lk
3. වෙනත්- https://youtu.be/Mw-9NmdB9MQ

   https://www.youtube.com/watch?v=sdVzN8DIYuU

   https://www.youtube.com/watch?v=bBlwqx2h4uo

<u>වෙනත් පොත් පත්</u>-

- 10 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත
- 10 ශ්‍රේණිය නර්තනය -ඥානසිරි පීරිස්

උඩරට-පහතරට-සබරගමු

සැකසුම-

නම-ආර්.ජේ.කිණිවිට.    තනතුර-ශ්‍රී.ලං.ගුරු සේවය 2-1    අධ්‍යාපන ආයතනය-කෑ/දෙහි/අටුළුගම මායාදුන්න ම.වි